# ඊනියා ජාතික ප්‍රශ්නය

මෙරට පවතින්නේ යැයි කියන ජාතික ප්‍රශ්නය අද බොහෝ විට සාකච්ඡා කෙරෙන්නේ විවිධ සංකල්ප ඔස්සේ බව පැහැදිලි ය. සිංහලයන් සාමාන්‍යයෙන් සිංහල ජාතිය යනුවෙන් සඳහන් කරත්දී යොදාගන්නේත් බටහිර සමාජයීය විද්‍යාඥයන් ශ්‍රී ලාංකික ජාතිය යනුවෙන් සඳහන් කරත්දී යොදාගන්නේත් ජාතිය පිළිබඳ එකම සංකල්පයක් නොවන බව පැහැදිලි ය. දෙමළ ජනයා ජාතිය යනුවෙන් අදහස්කරන්නේ ජනවර්ගය යැයි සිතමි.

බටහිර සමාජයීය විද්‍යාඥයන් දන්නේ ජාතික රාජ්‍යය හා එහි පුරවැසියන්ගෙන් සමන්විත ජාතිය ගැන ය. ඔවුන්ගෙන් ඇතැමකුට අනුව තවමත් ලංකාවේ ජාතික රාජ්‍යයක් හෝ ජාතියක් හෝ ගොඩනැගී නැත. අප කලින් ද සඳහන්කර ඇති පරිදි ඔවුන්ගෙන් ඇතැමකුට අනුව ජාතිය යන්න මිථ්‍යාවකි. එබැවින් ඔවුහු ජාතිය ගොඩනැගීමක් ගැන කතා නොකරති. සිංහලයන්ගෙන් ඇතැමකුට අනුව සිංහල ජාතිය විජය රජු හා ඔහු සමග පැමිණි හත්සියයෙන් ඇරඹී ඇත. ඇතැමුන්ට අනුව සිංහල ජාතිය ඇති වී අවුරුදු තිස්දහසකට ද වැඩි ය. තවත් අය ද සමගින් අප කියන්නේ සිංහල ජාතිය පණ්ඩුකාභය රජු දවස ඇරඹි බව ය.

එයට අමතරව මහාජාතිය සුළුජාතිය යන අදහස් ද ව්‍යවහාර කෙරෙයි. මෙය කිසිසේත්ම සංගත සංකල්පයක් නො වෙයි. මෙයින් කියැවෙන්නේ රාජ්‍යයක එක් ජාතියකට වඩා සිටිය හැකි බව ය. අවශ්‍ය නම් යමකුට ඒ එසේ යැයි ගැනීමට ද හැකි ය. එහෙත් ඒ සංකල්පය රාජ්‍යය හා වෙනත් සංකල්ප සමග සංගතවන්නේ කෙසේ දැයි පැහැදිලි කර දිය යුතු ය. රාජ්‍යයක තිබිය හැක්කේ එක් ජාතියක් පමණක් යැයි අපි විශ්වාස කරමු. එහෙත් අවශ්‍ය නම් ජාතියට අයත් වීමට අකමැති ජනවර්ග ද රාජ්‍යයේ තිබිය හැකි ය. වැදි ජනවර්ගය මේ සම්බන්ධ උදාහරණයක් වෙයි. ඔවුහු අවුරුදු දහස් ගණනක් සිංහල ජාතියට අයත් නොවී සිංහල සංස්කෘතියට අවශෝෂණය නොවී තම අනන්‍යතාව රැකගනිමින් එහෙත් සිංහල ජාතියට හා සිංහල රාජ්‍යයට අභියෝගයක් නොවෙමින් මෙරට ජීවත්වූහ. ඔවන් කිසි විටෙකත් වෙන ම රාජ්‍යයක් ගොඩනැගීමට උත්සාහ කර නොතිබීම මෙහි දී වැදගත් වෙයි.

ඒ ඒ අය ජාතිය ගැන කතාකරන්නේ විවිධ සංකල්පවලට අනුව බව පැහැදිලි ය. ජාතිය යනු මිථ්‍යාවක් යැයි නොසලකන බටහිර සමාජයීය විද්‍යාඥයන්ගේ අදහසට අනුව මෙරට රාජ්‍යයක් ඇත. එහෙත් ජාතික රාජ්‍යයක් නැත. මෙරට රාජ්‍යයක් ඇතැයි ඔවුන් කියන්නේ නිශ්චිත දේශසීමා ඇතුළත විධායක ව්‍යවස්ථාදායක, අධිකරණ යන අංග සහිතව හමුදාවක් ද ක්‍රියාත්මක වෙමින් රාජ්‍යයකට අවශ්‍ය වෙනත් ආයතන ද මෙරට ස්ථාපිත වී ඇති බැවිනි. එහෙත් මෙරට ජාතික රාජ්‍යයක් නැතැයි ඔවුන් කියන්නේ සියළු ජනවර්ග විසින් මේ රාජ්‍යයේ අධිකාරය පිළිගනු ලැබ නොමැති බැවිනි.

අද මෙරට රාජ්‍යයට අභියෝගයක් එල්ල වී ඇත්තේ ප්‍රභාකරන්ගේ නායකත්වයෙන් යුත් කොටි සංවිධානයෙන් පමණකි. අද වන විට වෙනත් කිසිම දේශපාලන පක්ෂයක් හෝ කණ්ඩායමක් හෝ රාජ්‍යයට අභියෝග නොකරයි. රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ (උදාහරණයක් ලෙස ඒකීය ද සන්ධීය ද ආදී වශයෙන්) විවිධ මතිමතාන්තර තිබුණ ද, අනෙක් සියළු පක්ෂ හා සංවිධාන රාජ්‍යයේ අධිකාරය පිළිගනියි. ඒ ඇතැම් සංවිධාන කලක් රාජ්‍යයේ අධිකාරය නොපිළිගත්ත ද, අද ඒ තත්වය වෙනස් වී ඇත.

ප්‍රභාකරන්ගේ නායකත්වයෙන් යුත් කොටි සංවිධානය කියන්නේ තමන් දෙමළ ජනතාවගේ එකම නියෝජිතයා බව ය. අප ඒ ප්‍රකාශය පිළිගන්නේ නම් ඉන් අදහස්වන්නේ දෙමළ ජනයා කොටි සංවිධානය අනුව යමින් මෙරට රාජ්‍යයේ අධිකාරය නොපිළිගන්නා බව ය. එහෙත් ප්‍රභාකරන්ගේ කොටි සංවිධානය මෙරට දෙමළ ජනයා සියල්ලන් ම නියෝජනය නොකරන බව ඇතැම් විට බටහිර රටවල් නොපිළිගත්ත ද, මෙරට ක්‍රියාත්මක වන අනෙක් දේශපාලන පක්ෂ හා සංවිධාන දනියි. ඇතැම් පුද්ගලයන් කොටි සංවිධානය ගැන කුමක් කීව ද ඒ සංවිධානය උතුරු හා නැගෙනහිර පළාත්වල සියළු දෙමළ ජනයා නියෝජනය නොකරන බව පැහැදිලි ය.

© Prof. Nalin De Silva

එසේ නම් අද මෙරට රාජ්‍යයේ අධිකාරය නොපිළිගන්නේ කොටි සංවිධානයේ සාමාජිකයන් හා ඔවුන්ට හිතවත් කිහිප දෙනකු පමණක් බව අවශ්‍ය නම් සමීක්ෂණයක් පවත්වා දැනගත හැකි ය. කොටි සංවිධානය හමුදා මෙහෙයුම්වලින් පරාජය කිරීමෙන් පසු තවදුරටත් රාජ්‍යයේ අධිකාරය නොපිළිගන්නා කිසිවකු නොමැති වනු ඇත. එහෙත් එපමණකින් මෙරට එක් ජාතියක් ඇතිවිය හැකි ද? ජාතික රාජ්‍යයකට අවශ්‍ය රාජ්‍යයක් හා ඒ රාජ්‍යයේ අධිකාරය පිළිගන්නා පුරවැසියන් යැයි කියන අයට නම් එවිට මෙරට ජාතික රාජ්‍යයක් ඇතැයි පිළිගැනීමට සිදුවනු ඇත. මෙයින් පැහැදිලි වන්නේ ජාතික රාජ්‍යය සංකල්පයෙහි ඇති දුර්වලකම් ය.

ජාතික රාජ්‍යය සංකල්පයෙහි එල්ලී සිටින බටහිර සමාජයීය විද්‍යා උගතුන් අද උත්සාහ කරන්නේ දෙමළ හා මුස්ලිම් ජනවර්ගයන්ට බලය බෙදා සන්ධීය රාජ්‍ය ව්‍යුහයක් මගින් මෙරට ජාතික රාජ්‍යයක් ඇතිකිරීමට ය. එවිට දෙමළ ජනයා කිසි ප්‍රශ්නයක් නැතිව රාජ්‍යයේ අධිකාරය පිළිගැනීම නිසා මෙරට ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය විසඳෙනු ඇතැයි ඔවුහු කල්පනා කරති. එහෙත් මෙරට දෙමළ ජනයාගෙන් අති විශාල පිරිසක් ජීවත්වන්නේ උතුරු හා නැගෙනහිර පළාත්වලින් පිටත ය. එබැවින් දෙමළ ජනයාගේ ප්‍රශ්නය විසඳන්නේ යැයි කියන සන්ධීය රාජ්‍යය ව්‍යුහයට අභියෝගයක් එල්ල වෙයි.

ඒ අභියෝගය අන්කිසිවක් නොව උතුරු හා නැගෙනහිර පළාත්වලින් පිටත ජීවත්වන දෙමළ ජනයාට බටහිර සමාජයීය විද්‍යාඥයන් කියන ආකාරයට බලය බෙදන්නේ කෙසේ ද යන්න ය. ඔවුන්ට බලය බෙදීම සඳහා වෙන ම ආකෘතියක් තනන්නේ ද? ඒ ආකෘතිය පළාත්වලට බලය බෙදීමේ ආකෘතියෙන් අනිවාර්යයෙන් ම වෙනස් විය යුතු ය. එවිට රට තුළ බලය බෙදීමේ ආකෘති දෙකක් ක්‍රියාත්මක වෙයි. එහි දී බටහිරයන්ගේ මතයට ම අනුව එක් කොටසකට අසාධාරණයක් සිදු නොවන්නේ ද?

මුස්ලිම් ජනයා සම්බන්ධයෙන් ප්‍රශ්නය මෙයටත් වඩා බරපතළ ය. දෙමළ ජනයාගෙන් සියයට හතළිහකට ටිකක් වැඩි ප්‍රමාණයක් අද උතුරු හා නැගෙනහිර පළාත්වල ජීවත්වන නමුත් මුස්ලිම් ජනයාගෙන් සියයට තිහක්වත් නැගෙනහිර පළාතේ ජීවත් නො වෙති. ඉතිරි සියයට හැත්තෑවකට පමණ බලය බෙදන්නේ කෙසේ ද? මෙහි දී කිසිවකුට කිවහැක්කේ දැනට බලය බෙදීමට හැකි ටික දෙනාටවත් බලය බෙදමු යන්න ය. එහෙත් ඒ සාර්ථක පිළිතුරක් නොවන්නේ දෙමළ ජනයාගෙන් කෙටසකගේ පමණක් ඇතැයි කියන ප්‍රශ්නයට විසඳුම් දීම ඔවුන්ගේ මිම්මෙන් ගත්ත ද අසාධාරණයක් වන බැවිනි.

අනෙක් අතට බටහිර උගතුන්ට හා දේශපාලකයන්ට අවශ්‍ය වී ඇත්තේ දෙමළ ජනයාගේ ඊනියා ප්‍රශ්නය විසඳීම මිස ඔවුන්ගේ කොටසකගේ ප්‍රශ්නයක් විසඳීම නො වෙයි. තමන්ට දැනට විසඳිය හැක්කේ කොටසක පමණක් ප්‍රශ්නය බැවින් කිසිවක් නොකර සිටීමට වඩා අඩු තරමින් ඒ කොටසෙහි ප්‍රශ්නය විසඳීම යහපත් යැයි පැවසීම බංකොළොත්කමේ ලක්ෂණයක් පමණකි. කොටසකගේ පමණක් ප්‍රශ්නය විසඳීමට කතාකරන්නේ සියල්ලන්ට ම ඇතැයි කියන ප්‍රශ්නය විසඳීමට තමන් නොදන්නා බැවිනි.

බටහිර උගතුන් හා මෙරට ඇතැමුන් කියන ආකාරයට දෙමළ ජනයාට ප්‍රශ්නයක් ඇත. එහෙත් ඒ විසඳන්නේ කෙසේ දැයි ඔවුහු නො දනිති. එබැවින් ඔවුන් දන්නා ආකාරයට කොටසකගේ පමණක් ප්‍රශ්නය විසඳීමට කතාකරති. එහෙත් ඊනියා කොටසකගේ ප්‍රශ්නය යනු ඇතැම් දෙමළ නායකයන්ගේ අපේක්ෂාවක් පමණක් බව ඔවුන්ට අමතක වෙයි. මේ අපේක්ෂාව අන් කිසිවක් නොව තමන්ට මධ්‍යයෙහි ලබාගත නොහැකි යැයි සිතන බලය උතුරු හා නැගෙනහිර පළාත්වල දී ලබාගැනීම ය.

ඒ කෙසේවෙතත් අපේ මූලික ප්‍රශ්නය මෙරට ජාතියක් නැත්නම් ඒ ගොඩනගන්නේ කෙසේ ද යන්නත් ජාතියක් ඇත්නම් ඒ ජාතියට අද අයත් නොවන්නන් ඇත්නම් ඔවුන් ජාතියට අවශෝෂණය කර ගන්නේ කෙසේ ද යන්නත් ය. මෙහි දී ජාතිය යන්න මිථ්‍යාවක් යැයි සලකන බටහිර උගත්තු අපට වැදගත් නො වෙති. ඔවුන් ජාතිය යන්න මිථ්‍යාවක් ලෙස දකින්නේ බටහිර සමාජයීය විද්‍යාවන්ට ජාතිය යන්න වියුක්තව නිර්වචනය කිරීමට නොහැකි බැවිනි. ඒ බටහිර සමාජයීය විද්‍යාවන් පොට පටළවා හැනීමෙන් ඇති වී තිබෙන තත්වයකි. අපට ඒ ගැන වැඩි දුර සාකච්ඡා කිරීම අනවශ්‍ය ය.

© Prof. Nalin De Silva

මෙරට හා පිටරට බටහිර උගතුන් කිසි දිනෙක නොපිළිගන්නා කරුණ නම් මෙරට ජාතියක් ඇති වී බොහෝ කල්ගත වී ඇති බව ය. අප රටේ ජාතියක් ඇති වූයේ පණ්ඩුකාභය රජු දවස බව අපි පිළිගනිමු. ඒ ජාතියට අයත් නොවූ ජනවර්ගයක් ද විය. ඒ වැද්දි ජනතාව විය. අප කලින් ද සඳහන්කර ඇති පරිදි පණ්ඩුකාභය රජු දවස මෙරට එවකට විසූ යක්ෂ, නාග, දේව ආදී අනෙක් ගෝත්‍ර මෙන් ම භාරතයෙන් මෙරටට සංක්‍රමණය වූ අර්ධ වෛදිකයන් ද එකතුව සිංහල ජාතිය බිහිකරනු ලැබිණි.

එසේ ගොඩනැගුණු සිංහල ජාතියෙන් බාහිර ව සිටියේ වැද්දි ජනතාව පමණ ය. ඒ හැරෙන්නට සිංහල ජාතියෙන් බාහිර ව සිටි එකදු ජනවර්ගයක් ගැන කිසිම සාධකයක් නැත. එපමණක් නො වෙයි. මේ සිංහල ජාතියට පොදු සංස්කෘතියක් විය. ඒ සංස්කෘතිය ලෝකයේ වෙනත් කිසිම රටක දක්නට නො ලැබෙයි. ඉන් කියැවෙන්නේ සිංහල සංස්කෘතියට වෙනත් කිසිම සංස්කෘතියක බලපෑමක් නොවී ඇති බව හෝ සිංහල සංස්කෘතිය වෙනස් නොවන ඊනියා නිර්මල සංස්කෘතියක් බව හෝ නො වෙයි. ඒ වෙනත් බලපෑම් තිබුණ ද ඒ සියල්ල සිංහල සංස්කෘතිය විසින් අවශෝෂණය කරනු ලැබ ඇත. එමගින් සිංහල සංස්කෘතිය ද වෙනස් වී ඇත. එහෙත් සිංහල සංස්කෘතිය තම අනන්‍යතාව රැකගැනීමට සමත් වී ඇත.

මෙහි දී නැවත නැවතත් අවධාරණය කළ යුතු කරුණක් වෙයි. එනම් සිංහල ජාතිය මෙරටට පිට රටකින් නොපැමිණි බව ය. සිංහලයන් යනු විජය රජුගෙන් හා ඔහු සමග පැමිණි හත්සියයෙන් ආරම්භ වී නම් ඉන් කියැවෙන්නේ සිංහලයන් මෙරටට වෙනත් ප්‍රදේශයකින් පැමිණ ඇති බව ය. අද මෙරට ඇති ප්‍රධාන ම ප්‍රශ්නයක් වී ඇත්තේ සිංහලයන් එලෙස පිටින් පැමිණි ජාතියක් බවට මෙරට මුල් බැසගෙන ඇති මතය ය. සිංහලයන් එසේ පිටින් පැමිණ ඇති බවට ඇති විශ්වාසය නිසා වැද්දි ජනයා ඊනියා ආදිවාසීන් ලෙස හැඳින්වෙති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva